# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2263/41 - 2022 ජනවාරි මස 21 වැනි සිකුරාදා - 2022.01.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

**1949 අංක 58 දරන මුදල් නීති පනත**

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 68 වන වගන්තිය සමග කියවිය යුතු 10 (c) වගන්තිය යටතේ සකස් කළ රීතීන්

**නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්,**
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති.

2022 ජනවාරි මස 21 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ දී ය.

**හෝටල් සේවා සැපයුම්කරුවන් විසින් ශ්‍රී ලංකාව ඇතුළත විදේශ විනිමය භාර ගැනීම**

1. මෙම රීති "2022 අංක 1 දරන හෝටල් සේවා සැපයුම්කරුවන් විසින් ශ්‍රී ලංකාව ඇතුළත විදේශ විනිමය භාර ගැනීමේ රීති" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ය.

2. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින්, 1949 අංක 58 දරන (සංශෝධිත) මුදල් නීති පනතෙහි 10 (c) වගන්තියෙහි විධිවිධාන සමග එක්ව කියවිය යුතු එම පනතේ 68 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කරමින්, හෝටල් සේවා සැපයුම්කරුවන් විසින් ශ්‍රී ලංකාව ඇතුළත විදේශ විනිමය භාර ගැනීමට අදාළ රීතීන් මෙමගින් නිකුත් කරනු ලබයි.

3. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි බලපත්‍රලාභී හෝටල් සේවා සැපයුම්කරුවන්, ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයින්ට සපයනු ලබන සේවාවන් සම්බන්ධයෙන් වන ගෙවීම් මෙම රීතීන් නිකුත් කරන දින සිට ක්‍රියාත්මක වන පරිදි විදේශ විනිමයෙන් පමණක් භාරගනු ලැබිය යුතු ය.


1A - G 35884 — 60 (2022/01)

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

4. ඉහත 3 රීතියට අනුව භාර ගත් විදේශ මුදල්, එලෙස විදේශ විනිමය භාර ගත් දින සිට ව්‍යාපාරික දින තුනක් ඇතුළත බලපත්‍රලාභී වාණිජ බැංකුවකට හෝ අවසරලත් බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට විකිණීම හෝ හෝටල් සේවා සැපයුම්කරුවාගේ ව්‍යාපාරික විදේශ මුදල් ගිණුමකට බැර කළ යුතු ය.

5. ඉහත 3 රීතියට අනුව විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පත් හරහා සිදු කරන සියලුම ගෙවීම් හෝටල් සේවා සැපයුම්කරුවාගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට වහාම බැර කළ යුතු ය.

6. ඉහත 3 රීතියට අගතියකින් තොරව ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයින් විසින් ශ්‍රී ලංකාවට ගෙන එන ලද විදේශ මුදල් බලයලත් වෙළෙන්දෙකු හෝ පරිසීමිත වෙළෙන්දෙකු හරහා ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරන ලද බවට අදාළ මුල් ලේඛනගත සාක්ෂි ලබා දෙන්නේ නම් හෝටල් සේවා සැපයුම්කරුට ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකුට සපයනු ලබන සේවාවන් සඳහා ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීම් භාරගත හැකි ය.

7. හෝටල් සේවා සැපයුම්කරුවකු, ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයකු විසින් ඔහුට සපයන ලද මුල් ලියකියවිලි පිටසන් කළ යුතු අතර, එම ලේඛනගත සාක්ෂිවල පිටපත් ශ්‍රී ලංකා රුපියල් භාරගත් දිනයේ සිට, අදාළ වන පරිදි වසර 6 ක කාල සීමාවක් හෝ නීතියෙන් පනවන ලද වෙනත් වාර්තා රඳවා තබා ගැනීමේ කාල සීමාවක් දක්වා තබා ගත යුතු ය.

8. සියලුම හෝටල් සේවා සැපයුම්කරුවන් විසින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් සහ/හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් කලින් කලට නියම කරන පරිදි, වාර්තා සහ/හෝ ලේඛන ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවට පිටපත් සහිතව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට යොමු කළ යුතු ය.

9. සෑම හෝටල් සේවා සැපයුම්කරුවෙකු විසින්ම මෙම රීති හා අදාළව පවත්වාගෙන යනු ලබන වාර්තා සෝදිසි කිරීමට හෝ පරීක්ෂා කිරීමට සහ මෙම රීතිවලට පූර්ණව සහ නිසි ලෙස අනුකූල වීම සහතික කිරීම සඳහා ගනු ලබන සියලුම ක්‍රියාමාර්ග විමර්ශනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා හෝ නියෝජ්‍ය අධිපතිවරයා විසින් බලය පවරනු ලැබූ ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරීන්ට බාධාවකින් තොරව ඉඩ ලබා දිය යුතු ය.

10. ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට ඕනෑම හෝටල් සේවා සැපයුම්කරුවෙකු විසින් මෙම රීතිවලට අනුකූල නොවීම හෝ උල්ලංඝනය කිරීමකට එරෙහිව පියවර ගැනීමට අයිතිය ඇත.

11. මෙම රීතිවල කාර්යය සඳහා ;

- "බලයලත් වෙළෙන්දා" යන්නෙහි අර්ථය 2017, අංක 12 දරන විදේශ විනිමය පනතෙහි දක්වා ඇති පරිදි වේ.

- "විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත" යන්නෙන් බැර, හර හෝ වෙනත් යම් ආකාරයක වටිනාකමක් මාරු කිරීම සඳහා භාවිතා කරන්නාට හැකියාව ලබා දෙන කාඩ්පතක් හෝ උපකරණයක් අදහස් වන අතර, එයට ණය කාඩ්පත්, හර කාඩ්පත් සහ විනිමය පාලන පනතේ විධිවිධානයන්ට අනුකූල වන බවට බලයලත් වෙළෙඳුන් විසින් ගනුදෙනු විස්තර හඳුනාගත හැකි අවස්ථාවලදී වටිනාකම තැන්පත් කළ කාඩ්පත් ද ඇතුළත් වේ.

- "විදේශ විනිමය" යන්නෙහි අර්ථය 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි දක්වා ඇති පරිදි වන අතර නම් කරන ලද විදේශ විනිමය භාවිතයෙන් සිදු කරන එකී ගනුදෙනු 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ රෙගුලාසි හා 1988 අංක 30 දරන බැංකු පනත යටතේ නිකුත් කරන ලද අක්වෙරළ බැංකු විධානවලට යටත්ය.

- "ව්‍යාපාරික විදේශ මුදල් ගිණුම්" යන්නෙහි අර්ථය අංක 2213/38 හා 2021.02.03 දිනැති *ගැසට්* නිවේදනයේ ප්‍රකාශයට පත්කර ඇති පරිදි 2021 අංක 5 දරන විදේශ විනිමය (විදේශ විනිමය ගනුදෙනුවල යෙදීම සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වා ගෙන යාම) රෙගුලාසිවල සඳහන් අර්ථයට සමාන වේ.

- "හෝටල් සේවා සැපයුම්කරුවන්" යන්නෙන් 2005 අංක 38 දරන සංචාරක පනතේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී බලපත්‍ර ලබා ඇති හෝටල්, විලා, සංචාරක බංගලා, ආගන්තුක නිවාස, හෝම් ස්ටේ හෝ ඊට සම්බන්ධ වෙනත් ආයතන ඇතුලු සංචාරක ව්‍යවසායන් සහ සංචාරක සේවා අදහස් වේ.

- "ශ්‍රී ලංකාවෙන් පිට නේවාසික තැනැත්තා" යන්නෙහි අර්ථය 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දක්වා ඇති පරිදි වේ.

- "පරිසීමිත වෙළෙන්දා" යන්නෙහි අර්ථය 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දක්වා ඇති පරිදි වේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.